# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 ශ්‍රේණිය.

සැකසුම - නිර්මලී නිලානි
ර / අකරැල්ල විද්‍යාලය.

# 01 පාඩම

# ගොවි බිරියගේ නුවණ.



# ජන කතා.

'ජනකතා යනු පොදු ජනතාව අතර බහුල වශයෙන් මුඛ පරම්පරාගතව පවත්නා කතාන්දර'

(සිංහල ශබ්දකෝෂය - 9 කාණ්ඩය)



‘මානව සංහතියේ හදගැස්ම වැඩෙන්නට පටන් ගත් කාලයේ සිට ම ජන කතා මිනිසාගේ ජීවන න්‍යාය පත්‍රය කෙරේ බලපාන්නට වුයේ ය. කතා කීමේ කලාවෙන් තොර කිසිම ජන යුගයක් ගැන හෝ මිනිස් සාමාජික කණ්ඩායමක් ගැන සිතන්නට බැරිය. ජන කතා කලාව එක් එක් පරම්පරාවේ බුද්ධිය උකහා ගනිමින් ඒ ඒ පරපුරේ සංස්කෘතික ඉගි බද්ධ කොට ගනිමින් වැඩෙන්නේ ය.’

( නයියාරා රග්මන් සින්ධි ජනකතා විශේෂඥ )



'ජන කතා ගොඩ නැගෙන්නේ සමූහයට අවශ්‍ය නිසයි . එය මිනිස් අවශ්‍යතා සපුරයි.'

(නන්දසේන රත්නපාල , 1995)

## ජන කතා වල දැකිය හැකි ලක්ෂණ.

- සෑම සමාජයකට ම පොදු අංගයක් වීම.
- මුඛ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීම.
- දෙවියන් , සුරංගනාවන්, යක්ෂයින්, භූතයන් හා යම් බලයක් ලැබූ මනුෂ්‍යයන් මුල් කරගෙන කතා නිර්මාණය වීම.
- එය රසවිඳින පුද්ගලයා තුළ කුතුහලය , බිය , ගෞරවය යනාදි හැඟීම් ඇති වීම.
- සමාජයේ පවතින විවිධ විශ්වාස ධර්මතා මේ තුළ දක්නට ලැබීම.

# ජන කතා වර්ග.

- ජනකතා
  - මිත්‍යා කතා
    - උපදේශාත්මක කතා
    - වීර කතා
  - පුරාණෝක්ති
    - උපමා කතා

# ජන කතා අපට වැදගත් වෙන්නේ ඇයි ?.

★ දැනුම ලබා ගැනීමට

★ සමාජානුයෝජන කාර්යයට

★ මනුෂ්‍ය හැසිරීම් රටා සාධාරණීකරණය සඳහා

★ සමාජයේ පවතින විවිධ විශ්වාස ධර්මතා පිළිබඳ ඉගෙනීමට

★ ජීවිත අභියෝග වලට මුහුණ දීමට අවශ්‍ය දැන නුවණ ලබා ගැනීමට

★ සාරධර්ම අභ්‍යන්තරීකරණය ට

★ කරුණු පහදා දීමට

★ සමාජ පාලනයට

★ පුද්ගල රසඥතාව වර්ධනයට

★ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැනගැනීමට



# ජනකතා වලට උදාහරණ.

**දේශීය**

- අන්දරේගේ කතා
- ගමරාලගේ කතා
- මහදැනමුත්තාගේ කතා
- ඉතිහාසය පිළිබඳ කතා (රජවරු ස්ථාන...)

**විදේශීය**

▲ ඊසොප්ගේ උපමා කතා

▲ අරාබි නිසොල්ලාසය

▲ බංගලාදේශ ජනකතා

▲ පංචතන්ත්‍රය

▲ හිතෝපදේශය







- සිංහල ජන කතා ආරම්භ වන්නේ 'එකෝමත් එක රටක' යනුවෙනි

- ලෝක ජන කතා දිනය සෑම වර්ෂයක ම අගෝස්තු 22 වැනිදා ය. (යුනෙස්කෝ සංවිධානය )

- ජන කතා කලාවේ ප්‍රධාන අරමුණ වන්නේ ජනතාවගේ සිත් පහන් කරමින් ඔවුන්ට එදිනෙදා මුණ පාන්නට සිදුවන ප්‍රශ්න තැම්පත් ලෙස නිරාකරණය කළ හැකිවන පිණිස ඔවුන්ට තිවුණු මනසක් සකස් කර ගන්නට ඉඩකඩ සපයාදීමයි .

# ගොවි බිරියගේ නුවණ.

## (පාකිස්ථාන ජන කතාවකි)

කතාව කියවන්න


# ප්‍රස්තාව පිරුළු සහ ඉඟිවැකි.

- සිංහල භාෂාව තුළ සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් ලෙස ප්‍රස්තාව පිරුළු හා ඉඟිවැකි භාවිතයට ගැනෙයි.
- මේවා භාෂාව රසවත් කිරීමට යොදා ගනියි.

# ප්‍රස්ථාව පිරුළු.

## අත්දැකීම් සම්භාරයක් කැටි කළ කෙටි යෙදුම්

- පරංගියා කෝට්ටේ ගියා වගෙයි.
- පුහුල් හොරා කරෙන් දැනේ.
- කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගෙයි.
- රයිගමයයි ගම්පලයයි වගේ.
- ගඟට ඉනි කැපුවා වගේ.



- අබරා සිල් ගත්තා වගෙයි
- ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගෙයි
- පිස්සිගේ පලා මල්ල වගෙයි
- ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගෙයි
- අටුව කඩා පුටුව හැදුවා වගෙයි
- වක්කඩේ හකුරු හැංගුවා වගෙයි
- ගහේ කටු උල් කරන්න ඕන නෑ

# ඉඟි වැකි.

අමුතුවෙන් ආරෝපණය කළ අර්ථය රූඪී ය යි

| | |
|---|---|
| ★ අන්ධර දෙමළ | නොතේරෙන දේවල් |
| ★ සායම ගියා | නම්බුව නැති වුණා |
| ★ අං ඇවිල්ලා | ආඩම්බර වෙලා |
| ★ අත මාරුවක් | ණය මුදලක් |
| ★ අත දීම | උදව් කිරීම |

- ආවට ගියාට නොසැලකිලිමත්ව
- අනෝරා වැස්සක් මහා වැස්සක්
- ඇගේ මාළු නටනවා තද කේන්තියක් ඇතිවීම
- ලෑල්ලට පෑගුවා ඉතා වේගයෙන් ගියා
- හිත උණු වුණා දුක හිතුණා
- ගල් පැලෙන බොරු ඉතා ලොකු බොරු
- ඇගේ ලේ වතුර වුණා ඉතා දැඩි බියට පත්වීම

# පැවරුම්

## අවබෝධය

1. ව්‍යාඝ්‍රයා ගොවියා වෙත පැමිණියේ කුමන අරමුණකින් ද?
2. ගොවියා ව්‍යාඝ්‍රයාට පොරොන්දු වූයේ කුමක් ලබා දීමට ද?
3. මේ කතාවට අනුව, පාන් නිෂ්පාදනයේ දී ගවයාගේ දායකත්වය ලැබෙන්නේ කුමන කාර්යයක් උදෙසා ද?
4. අසරුවකුගේ වෙස් ගත්තේ ගොවි බිරිය බව හිවලා හඳුනා ගත්තේ කෙසේ ද?
5. මෙම කතාවෙන් යුගල පද දෙකක් උපුටා දක්වන්න.

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල අදහස ලියන්න.
   - i. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගෙයි
   - ii. බීරි අලින්ට වීණා ගායනා කරනවා වගෙයි
   - iii. ඉඟුරු දී මිරිස් ගත්තා වගෙයි
   - iv. ඉබ්බා දියේ දැම්මා වගෙයි
   - v. මඬේ සිටුවූ ඉන්න වගෙයි

2. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන යෙදුම් වෙනුවට ගැළපෙන රූඩියක් ඇතුළත් කර නැවත ලියන්න.

   උදාහරණ: ගොවියා **උදැසනින් ම** කුඹුරට ගියේ ය.
   ගොවියා **කුකුළා අතින් ගෙන** කුඹුරට ගියේ ය.

   - i. කමල් **බොරු පුරසාරම් කියන්නෙකි.**
   - ii. විභාගය සමත් වීම මගේ **ඉමහත් ප්‍රීතියට හේතු** විය.
   - iii. පන්ති නායකයා මගේ **හොඳ මිත්‍රයෙකි.**
   - iv. අසල්වැසියන් සමග කිසිදු **සුහදතාවක්** නැතැයි ඇය කීවා ය.
   - v. අප ගමන් කළ රථය තිරිංග ක්‍රියාත්මක වීම නිසා අවසාන මොහොතේ අනතුරින් බේරිණි.

3. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල හෝ රූඩිවල හෝ අදහසට සමීප අර්ථයක් දෙන ප්‍රස්තාව පිරුළක් හෝ රූඩියක් හෝ ලියා දක්වන්න.
   - i. නිකිණි හොයනවා
   - ii. හිස හැරුණු අතේ යනවා
   - iii. අනූනවයෙන් බේරුණා
   - iv. අතු කඩා මොර කන්නා වගෙයි
   - v. ඇගෙන් ඇටයක් ගන්නවා වගෙයි

## ප්‍රායෝගික අභ්‍යාස

1. ප්‍රස්තාව පිරුළු පහක් සහ ඒවාට මුල් වූ කතන්දර ඇතුළත් කර පොත් පිංචක් සකස් කරන්න.
2. රූඩි සහ ඉඟි වැකි එක් රැස් කර ලේඛනයක් සකස් කරන්න.